සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සිංහල සාහිත්‍ය රසාස්වාදය

**නම/විභාග අංකය :-** ........................................................... **කාලය: පැය 03යි.**

<u>සැලකිය යුතුයි.</u>

- **I** කොටසෙහි 01 , 02 ප්‍රශ්නවලටත් **II** කොටසෙහි 03 වැනි ප්‍රශ්නයටත් **III** කොටසෙහි 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

### I කොටස

(01) අංක **(i)** සිට **(v)** තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති (අ) , (ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ''මම එතනට කැඳවා ගෙන එමි. එකල ඇස් පුරා දැක පියව''

(අ) මෙසේ පවසන්නේ කවු ද?

(ආ) මෙහි එතැනට යනුවෙන් හඳුන්වන්නේ කවර ස්ථානයක් ද?

(ii) "ගියත් සුළු ගෙයි, වහා එව" යි කිවූ ය.

(අ) මෙසේ පවසන්නේ කවු ද?

(ආ) මෙහි සුළු ගෙයි යන්නෙහි අදහස ලියන්න.

(iii) ''ඒක යස ඇත්ත. ඉබ්බෙක් පියෑඹුවා වගේයි"

(අ) මේ ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

(ආ) මෙය ප්‍රකාශ කළේ කුමන අවස්ථාවේ ද?

(iv) නොහිමි සුවඳ විහිදෙන කස්තුරි නිමල
උතුම් මුව නැබෙහි තැබි බඹ නැණ විකල
වී නම් මෙමට මහ බඹු පදවි යම් කල
තබම් බොරු කියන දුදනන්ගේ දිව මුල

(අ) පළමු පද්‍ය පාද දෙකෙහි අර්ථය ලියන්න.

(ආ) අංකිත පදවල අර්ථ ලියන්න.

(iv) පෙරදිග ගොරහැඩි රකුසෝ,
මගේ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොවගත්ත
කලු රෙදි පොට
මොකටද මේ
තීරුවලට ඉරා දමන්නෙ

(අ) මේ කවියෙහි ඇති කාව්‍යාලංකාරයක් උපුටා දක්වන්න.

(ආ) මෙම පැදි පෙළේ රචකයා කවු ද? (ලකුණු 4 × 5 = 20)

(02) පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ

බෝඹු ඉදල දලු ලා දෝ නො ලා දෝ
කෙකටිය මලේ වක යා දෝ නො යා දෝ
කැලණි ගඟේ ඔරු යා දෝ නො යා දෝ
කළුගෙ නගා මෙහි ඒ දෝ නො ඒ දෝ

කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ
නළල් වටින් එන දාඩිය මුතු කැටියේ
අත පාමුදු පය පාමුදු වයිරොඩියේ
මට පිටුපා ගෙට යනව ද සුරතලියේ

අල්ලා ගෙන නෙරිය අතකින් කිම් ද නගෝ
වසාගෙන දෙතන අතකින් කිම් ද නගෝ
හිමියෙක් නැති ගමන් තනි මඟ කිම් ද නගෝ
අම්බලමේ ඉඳලා අපි යම් ද නගෝ

(i) ගොවිතැනින් ජීවිතය ගෙවූ ජනකවියාට අත්විඳින්නට සිදු වූ දුක් ගැහැට
(ii) ජන කවියේ කැපී පෙනෙන ලක්‍ෂණ
(iii) ජනකවියා උපයුක්ත කරගත් කාව්‍යාලංකාර
(iv) විවිධ ජීවන වෘත්තීන් ජන කවියට වස්තු විෂය කර ගැනීම
(v) අව්‍යාජව, සංයමයෙන් යුක්තව තම අදහස් කාව්‍යාත්මකව ප්‍රකාශ කිරීම

(ලකුණු 5 × 5 = 25)

## II කොටස

- **පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් පිළිතුරු සපයන්න.**

(03) "දේවීනි, තොපගේ පුතණුවන් අභිෂේක කරවා නාටක ස්ත්‍රීන් හා ඓශ්වර්ය පාවා දී ජීවත් වන්නා වූ අපි රාජ්‍යයෙහි පිහිටියාහුගේ ශ්‍රී විභූතිය දකුම්හ. මේ මුළු දඹදිව යම් රජක්හුගේ දුවක කැමති වේ ද උන් ගෙන්වා අගමෙහෙසුන් කරම්හ, කනර රජ්ජුරු කෙනෙකුන්ගේ කුමාරිකාවක කැමැත්තෝ ද උන්ගේ අභිප්‍රාය දැන කියව" යි කීහ. බිසවුන් යහපතැයි ගිවිස කුමාරයන්ට මෙපවත් කියා අභිප්‍රාය විචාරා ගෙන එවයි කියා කම්මිත්තක යවූහ. ඒ ස්ත්‍රී ගොසින් බෝධිසත්ත්වයන්ට එපවත් කිවු ය. ඒ අසා මහ බෝසතාණෝ "මම රූ නැත්තෙමි. රූපශ්‍රීන් යුක්ත වූ රාජ කුමාරිකාවක් ගෙනෙන ලද නම් මා දැක යකකු මෙන් විරූප වූ මොහුගෙන් මට කම් කිම් දැයි පලා යන්නී ය. ඒ අපට ලජ්ජා කටයුතු වන්නේ ය. එහෙයින් මට ගෘහ වාසයෙන් ප්‍රයෝජන නැත. මාපිය දෙ දෙනා ජීවත් වන තෙක් උපස්ථාන කොට ගුරු දෙ දෙනා ඇවෑමෙන් ගොස් මහණ වෙම් ය සිතා මහබෝධිසත්ත්වයෝ තමන්ගේ මේ අදහස ඒ කම්මිත්තට කිවු ය. ඕ තොමෝ ගොස් එපවත් බිසවුන්ට කිව. බිසවු එපවත් රජ්ජුරුවන්ට කීහ. ඒ අසා රජ්ජුරුවෝ නො සතුටුව නැවත කීප දවසකින් එලෙස ම කියා යවූ ය. බෝධිසත්වයෝ නො කමැත්තේ යයි තුන් යලක් වළකා

සතර වෙනි වාරයෙහි දෙමවුපියන් කීවා නො කොට වරදවා පිළිපැදීම කටයුතු නො වෙයි, ඊට නිසි උපදෙසක් කෙරෙමියි සිතා මහා බෝධිසත්වයෝ තරාල් දෙටුවකු කැඳවා බොහෝ රත්රන් දී එක් ස්ත්‍රී රූපයක් කොට ගෙනෙවයි කියා ඔහු නික්මවා තුමූ රත්රනින් ස්ත්‍රී රූපයක් කළෝ ය.

(i) මෙම උද්ධෘතයේ සඳහන් ආකාරයට බෝසතුන්ගේ අභිප්‍රාය කුමක් ද? (ලකුණු 05)

(ii) බෝසතුන් තමාගේ ස්වරූපය ගැන පවසන ආකාරය ඡේදයෙන් උපුටා ලියන්න. (ලකුණු 05)

(iii) ජාතක කතාකරුවා අපූර්වත්වයෙන් යුක්තව භාෂාව හසුරුවා ඇති ආකාරය දැක්වෙන නිදසුන් දෙකක් ඡේදයෙන් උපුටා ලියන්න. (ලකුණු 05)

(iv) තම දරුවන් වෙනුවෙන් දෙමව්පියන් සිය යුතුකම් ඉටුකරන ආකාරය මෙම ඡේදය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25)

**නැතහොත්**

| | |
|---|---|
| ගන්තුන තුලානේ අලියා වැටුණු වැ | වේ |
| සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො | වේ |
| තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැ | වේ |
| රන් වන් කරල් බරවී දැන් බිමට නැ | වේ |
| | |
| ඔහුගේ ගමට මා ගිය ඒ පළමු | වර |
| තවමත් සිතේ ඇත අමතක නො වන | යුර |
| හේනට ගොසින් ගෙන් හූවක් තරම | දුර |
| එනවා දිටිමි මිටි බැඳ ගෙන වියළි | දර |
| | |
| දරටික තබා සෙවණැති පලු ගසක | යට |
| පිස දම දමා දාඩිය එන නළල | පිට |
| මා එන තුරු ම සිට පෙන්වූ සිනහ | කට |
| තවමත් පෙනේ දුක් දොම්නස් අතර | මට |
| | |
| පෙර දැක නොමැති මුත් සුන්දර හාමි | විසින් |
| මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතකු | ලෙසින් |
| ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි | ගසින් |
| පිළිගැන්වීය මට සොම්නස පිරුණු | ඇසින් |
| | |
| පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි | වත්තේ |
| දුප්පත්කමයි හැම තැන ලකුණුව | ඇත්තේ |
| කෙලෙස ද කියා කළගුණ සැලකිය | යුත්තේ |
| දුන් සත පණහවත් ඔහු නැත පිළි | ගත්තේ |

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත්කමින් සැලකූ යුතුකමය සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුතී
සිහි වී මගේ කම්මුල රතු පැහැය ගතී

(1) පැදි පෙළෙහි වස්තු විෂය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(2) චිත්ත රූප මැවෙන ආකාරයට අත්දැකීම් විස්තර කිරීමට දක්වා ඇති දක්ෂතාව පෙන්වන නිදසුන් දෙකක් කවි පෙළෙන් උපුටා ලියන්න. (ලකුණු 05)

(3) "ගැමි අව්‍යාජත්වය පෙන්නුම් කරන කැඩපතක් ලෙස මෙම කවි පෙළ විශද වෙයි" නිදසුන් දෙකක් කවි පෙළෙන් උපුටා ලියන්න. (ලකුණු 05)

(4) මෙම පද්‍ය පන්තිය සඳහා කවියා යොදා ගෙන ඇති ආකෘතිය හා බස්වහර කවි පෙළේ සාර්ථකත්වයට ඉවහල් වී ඇති අයුරු නිදසුන් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25)

## III කොටස

- **මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

(04) ශ්‍රාවක සිත් තුළ හාස්‍ය රසය ජනනය කිරීම ජාතකකතාකරුවාගේ එක් අරමුණක් වී ඇත. කුස ජාතකය ඇසුරින් මෙම කියමන පැහැදිලි කරන්න. (ලකුණු 15)

(05) "තුංමං හංදිය" නවකතාවේ කථකයාගේ ළමා කාලය සතුටින් හා විනෝදයෙන් ද කුතුහලයෙන් ද පිරී තිබුණ එකක් බව නවකතාව ඇසුරින් සනාථ කොට දක්වන්න. (ලකුණු 15)

(06) පොදු මිනිස් දුර්වලතා හඳුනාගෙන ඒවා වෙනස් කිරීමට සුභාෂිත කවියා ගෙන ඇති උත්සාහය නියමිත පද්‍ය පන්තිය ඇසුරින් විමසන්න. (ලකුණු 15)

(07) අවස්ථා හා සිද්ධි නිරූපණයේ දී කෙටි කතාකරුවා දක්වා ඇති දක්ෂතාව "වෙසක් පහන" කෙටි කතාව ඇසුරින් විමසන්න. (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සිංහල සාහිත්‍ය රසාස්වාදය පිළිතුරු

**I කොටස**

(01) (i) (අ) සීලවති බිසව / කුස රජුගේ මව (ආ) ඇත්හලට

(ii) (අ) ජනපද කල්‍යාණිය

(ආ) විවාහවීමට නියමිත පුද්ගලයා / කුඩා ගෘහපතිය

(iii) (අ) වැලපීම

(ආ) වැලපීම නවකතාවේ ඉයෝනාගේ රථයෙන් තරුණයින් තිදෙනා රැගෙන යන අවස්ථාව

(iv) (අ) සීමාවක් නැති සුවඳක් විහිදුවන පිරිසිදු කස්තුරි, මහ බ්‍රහ්මයා විසින් උතුම් වූ මුවන්ගේ නාභියෙහි තැන්පත් කොට ඇත්තේ විපරිත බුද්ධියෙනි.

(ආ) නොහිම් - සීමාවක් නැති

මුව නැබෙහි - මුවාගේ නාභියෙහි

(v) (අ) පෙරදිග ගොරහැඩි රකුසෝ

(ආ) සිරි ගුණසිංහ (ලකුණු 4 × 5 = 20)

(02) (i) දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ - අලි ඇතුන්ගෙන් සිදුවන කරදර

දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ - දුප්පත්කම (ලකුණු 05)

(ii) අව්‍යාජත්වය, සරලබව, සංක්ෂිප්තභාවය (නිදසුන් දක්වා තිබිය යුතුය.) (ලකුණු 05)

(iii) නළල් විටින් එන දාඩිය මුතු කැටියේ - රූපක එළිසමය, විරිත, ලය, අනුප්‍රාසය (නිදසුන් දක්වා තිබිය යුතුය) (ලකුණු 05)

(iv) 1. වී ගොවිතැන 2. ඔරු පැදීම

(v) කන්ද උඩින් එන කිකිළිය ගෝමරියේ

අල්ලාගෙන නෙරිය අතකින් කිම් ද නගෝ

ආදී නිදසුන් ඇසුරෙන් පහදා තිබිය යුතුය. (ලකුණු 05)

(මුළු ලකුණු 25)

**II කොටස**

(03) (i) ගිහිගෙය අතහැරයාම (ලකුණු 05)

(ii) "මම රූ නැත්තෙමි. රූපශ්‍රීන් යුක්ත වූ රාජ කුමාරිකාවක් ගෙනෙන ලද නම් මා දැක යකකු මෙන් විරූප වූ මොහු ගෙන් මට කම් කිම් දැයි පලා යන්නී ය. ඒ අපට ලජ්ජා කටයුතු වන්නේ ය. (ලකුණු 05)

(iii) 1. මෙපවත් කියා අභිප්‍රාය විචාරා ගෙන එවයි කියා කම්මිත්තක යවූහ. ඒ ස්ත්‍රී ගොසින් බෝධිසත්ත්වයන්ට එපවත් කිවු ය.

2. එහෙයින් මට ගෘහ වාසයෙන් ප්‍රයෝජන නැත. මා පිය දෙ දෙනා ජීවත් වන තෙක් උපස්ථාන කොට ගුරු දෙදෙනා ඇවෑමෙන් ගොස් මහණ වෙමි ය සිතා (ලකුණු 05)

(iv) 1. රජු සීලවතී දේවිය හා පුතුගේ විවාහය ගැන සාකච්ඡා කරීම

2. රජ කුමරියක් සොයන්නට කීම

3. පුතු විවාහයට අකමැති වූ විට නැවත කිහිප දවසකින් එලෙසම කියා යැවීම

යන කරුණු පිළිතුරෙන් අපේක්ෂා කරයි. (ලකුණු 10)

(මුළු ලකුණු 25)

නැතහොත්

(i) මිල කළ නොහැකි ආගන්තුක සත්කාරය මුදලට තක්සේරු කිරීම

(ii) 1. පිස දම දමා දාඩිය එන නළල පිට

2. මා එනතුරු ම සිට පෙන් වූ සිනහ කට

3. ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු ඇසින්

(iii) 1. මා එන තුරු ම සිට පෙන් වූ සිනහ කට

2. මගේ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්

3. කෙලෙසද කියා කළගුණ සැලකිය යුත්තේ
අන් සත පණහවත් ඔහු නැත පිළි ගත්තේ

(iv) සිවු පද ආකෘතිය හා සරල සුගම බස්වහර ගැන දක්වා විස්තර කිරීම අවශ්‍යයි.

## <u>III කොටස</u>

04, 05, 06, 07 ප්‍රශ්නවලට උචිත නිදසුන් යොදා ගනිමින් වචන 150කට ආසන්න පිළිතුරක් ලියා තිබීම අපේක්ෂා කෙරේ.

| | |
|---|---|
| නිදසුන් තුනක් සඳහා | ලකුණු 03යි. |
| සමස්ත විස්තරයට | ලකුණු 12යි. |
| මුළු ලකුණු | ලකුණු 15යි. |

අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

www.lol.lk
Learn Ordinary Level

LOL.lk online Book Store

අමතන්න - 071 777 4440/0756999990/071 8540371



LOL.lk online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්










## කෙටි සටහන් පොත්










වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්වා ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers


